## 2019 වර්ෂය සඳහා ලංකා සතොස ලිමිටඩ් වෙත භාණ්ඩ සහ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා පොදු උපදෙස්, නියමයන් හා කොන්දේසි

### ලංකා සතොස ලිමිටඩ්
### වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

1. 2019 වර්ෂය සඳහා **වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධිත ලංකා සතොස ලිමිටඩ්** වෙත **භාණ්ඩ සහ සේවා** සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් **ලංකා සතොස ලිමිටඩ්** වෙබ් අඩවිය (www.lankasathosa.lk) මගින් **2018.11.30** දින සිට **2018.12.31** වන දින දක්වා අයකිරීමකින් තොරව බාගත කරගැනීම (Download) හෝ පහත සඳහන් ලිපිනයෙහි, 3වන මහලෙහි ස්ථාපිත **මිලදීගැනීම් අංශය** වෙත රු. 2,500/= ක් ගෙවා ලබාගැනීමට හෝ හැක.

2. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනී යන්නේ නම් එවැනි අයදුම්කරුවකු ලියා පදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. අයදුම්පතට ඇමිණිය යුතු සියලු ලිපි ලේඛණ අනුක්‍රමිකව අංකනය කළයුතුය. මුළු පිටු සංඛ්‍යාව ප්‍රධාන අයදුම්පතෙහි දකුණුපස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

3.1 **අයදුම්පත සමග අමුණා එවිය යුතු ලිපි ලේඛන පහත සඳහන් වේ.**

- සීමිත වගකීම් සහිත සමාගම් - සාංගමික සංස්ථාපත්‍රය.
- වෙනත් ආයතන - ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය.
- අදාල භාණ්ඩ සැපයීම සඳහා නෛතික බලය ඇති බවට සහතිකය (අත්සන් කරන්නා ව්‍යාපාරයෙහි බලයලත් අය බව සනාථ කිරීමට ප්‍රමාණවත් ලියකියවිලි)
- අයදුම් කරන ලද සැපයුම් හා සමාන ව්‍යාපාර සිදුකර ඇති බවට පලපුරුද්ද සනාථ කිරීමට අදාල විස්තර.

3.2 සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා නිෂ්පාදකයා නොවන අවස්ථාවකදී සැපයුම්කරු හෝ ඔහුගේ ප්‍රධානියා බලය ලත්, ගනුදෙනුකරු හෝ බෙදාහරින්නා වන බවට නිෂ්පාදකයා විසින් ලිඛිතව සහතික කළ යුතුය.

3.3 බැංකු ගිණුම සනාථ කරන ලිපියක්.

3.4 ලියාපදිංචි ගාස්තු/කාණ්ඩ ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවේ නිල් පැහැති පිටපත අනිවාර්යයෙන් ඇමිණිය යුතුය.

4. විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවශ්‍ය සියලු ලිපිලේඛණ සහිතව පහත සඳහන් ලිපිනයෙහි 3වන මහලෙහි ස්ථාපිත **මිලදීගැනීම් අංශය** වෙත අතින් භාර දීම කල හැක.

**අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්**

5. ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් එක් අයදුම්කරුවෙකුගෙන්, රු. 20,000/- ක (රුපියල් විසි දහසකි) කාණ්ඩ ගාස්තු වශයෙන් රු. 2,000/- ක (රුපියල් දෙදහසකි) (එක් කාණ්ඩයක් සඳහා) අය කරනු ලැබේ.

5.1 අයදුම්කරුවකු එක් ප්‍රධාන ආයතයනයකට වැඩියෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන්නේ නම් එබඳු, එක් එක් ප්‍රධානියා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කලයුතුය (අයදුම්පතෙහි 9 වන ඡේදය බලන්න).

5.2 ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ කාණ්ඩ ගාස්තු **ලංකා සතොස** ප්‍රධාන කාර්යාලයෙහි, 3වන මහලෙහි ස්ථාපිත මුදල් අංශයෙහි ගණකාධිකාරී වෙත ගෙවිය යුතුය.

6. අයදුම්කරුවන් වැට් බදු පණත යටතේ ලියාපදිංචි වී ලබා ගත් වැට් බදු සහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතුවේ. එම සක්‍රීය වැට් බදු අංකය, අධිකාරිය විසින් පත් කරන ලද විශේෂ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලබන අතර සාවද්‍ය වැට් අංක ලබාදී ඇති සැපයුම් කරුවන්ගේ ලියාපදිංචිය කිසිම දැනුම්දීමක් නොමැතිව අවලංගු කරන අතර ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාල බලධාරීන් දැනුවත් කිරීමට සිදු වේ.

7. ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට ‘‘ ඔව්/ නැත ’’ යන්න, පැහැර හැරීමකින් තොරව කපා දමන්න.

8. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ ප්‍රකාශයක් ඉදිරියෙන් “අදාළ නොවේ” යන්න සඳහන් කරන්න.

9. ලියාපදිංචි කිරීමෙන් පසුව යම් සමාගමක තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදු වුවහොත්, එම ඉල්ලීම සළකා බලනු ලබනුයේ, එම ඉල්ලීම සමග එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

10. ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ, සැපයීමට නියමිත භාණ්ඩයන්හි කිසිදු වෙනසක් සිදුකළ නොහැකකි බව සලකන්න.

11. අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් **කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය/ලංකා සතොස ලිමිටඩ්** වග කීම භාර ගනු නොලැබ්.

12. **ලංකා සතොස ලිමිටඩ්** වෙත **2019 වර්ෂය** සඳහා **භාණ්ඩ සහ සේවා** සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාල වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරීන් අමතා ලබාගත හැක. (කාර්යාල වේලාවන් තුළ පමණි)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මිලදීගැනීම්) හෝ ජ්‍යෙෂ්ඨ කළමණාකරු (මිලදීගැනීම්), **ලංකා සතොස ලිමිටඩ්.**

දුරකථන අංක: නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මිලදීගැනීම්) - 011- 2307526 : 071- 4501402
ජ්‍යෙෂ්ඨ කළමණාකරු (මිලදීගැනීම්)- 011- 2307542 : 077- 3487085

ෆැක්ස් : - 011- 2307529

13. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 (භාණ්ඩ සහ වැඩ) අංක 8.11.5 ‘ඇ’ දරණ වගන්තියේ උපදෙස් ප්‍රකාරව, කොන්දේසි පැහැර හැර ඇති/අසාධු ලේඛණ ගත කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙහි නම් සඳහන් සැපයුම්කරුවන්ට ලියාපදිංචි වීම සඳහා අවසර නොලැබේ.

14. මිලගණන් ඉදිරිපත් කළ පසු සැපයීම් සඳහා අවශ්‍ය පරිදි තොග තබා ගැනීම සැපයුම්කරු විසින් කළ යුතු අතර, 2019 වර්ෂය සඳහා **භාණ්ඩ සහ සේවා** සැපයීම සඳහා **ලංකා සතොස ලිමිටඩ්** යටතේ ලියාපදිංචි වන අවස්ථාවේදී අවම වශයෙන් දින 45ක ණය පහසුකම් සැපයීමට සියලු සැපයුම්කරුවන් ස්වයංක්‍රීයවම එකඟ වනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.

15. ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු / මිලගණන් අවශ්‍යතාවය පරිදි කැඳවනු ලැබේ. එසේ වුවද අවශ්‍ය අවස්ථාවන්හිදී සැපයුම්කරුවන් තෝරා ගැනීමේ සම්පූර්ණ අයිතිය **ලංකා සතොස ලිමිටඩ්** සතු වේ.

16. **වෙළඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය** වෙනුවෙන් **ලංකා සතොස ලිමිටඩ්** විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් සියලු අයදුම්පත් සලකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියාපදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන සැපයුම්කරුවන්, **ලංකා සතොස ලිමිටඩ් ආයතනයට**, 2019 වර්ෂය සඳහා **භාණ්ඩ සහ සේවා** සැපයීම වෙනුවෙන්, **ලංකා සතොස ලිමිටඩ් ආයතනය සමග** කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹිය යුතුය.

18. මිල ගණන් ඉල්ලා සිටි අවස්ථාවක, වාර 3කදී මිල ගණන් ඉදිරිපත් කිරීමට හා මිල ගණන් ලබා දීමට නොහැකි බව ("No Quote") දැක්වීම හෝ ඇණවුමක් නියමිත වේලාවට ක්‍රියාත්මක කළ නොහැකි හෝ ඉල්ලා සිටි අවස්ථාවක නියැදි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ සැපයුම්, පිරිවිතයරයන්ට අනුකූල නොවන හෝ අනුමත නියැදියට (SLS/ISO/ITI) වෙනස් සැපයුම් ඉදිරිපත් කරන හෝ සැපයුම්කරුගේ ලියාපදිංචිය දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ඇත.

19. 2018 වර්ෂය වෙනුවෙන් **භාණ්ඩ සහ සේවා** සැපයීම සඳහා **ලංකා සතොස ලිමිටඩ්** යටතේ ලියාපදිංචි සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි ලේඛණය, 2019 වර්ෂයට අදාල සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ලේඛණය නිකුත්කල පසු අවලංගු වේ.

20. **ලංකා සතොස ලිමිටඩ්** වෙත **2019 වර්ෂය සඳහා භාණ්ඩ සහ සේවා** සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය **කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශයේ ලේකම්** වෙනුවෙන් **සභාපති - ලංකා සතොස ලිමිටඩ්** සතු වේ.

**සභාපති**
ලංකා සතොස ලිමිටඩ්,
අංක 27, සතොස ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

<u>සැ.යු.</u> පරිගණක පද්ධතියට දත්තයන් ඇතුලත්කල යුතු බැවින් අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කල යුතුය.